# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,699 — 1959 මාර්තු 13 වැනි සිකුරාදා—13.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 623 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... | 624 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 638 |
| තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... | — |
| විවිධ දැන්වීම් ... ... | 638 |


## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ලංකා කාර්මික විද්‍යාලීය දෙපාර්තමේන්තුව, කණිෂ්ඨ කාර්මික විද්‍යාලය—ගාල්ල

**අධ්‍යයන වර්ෂය: 1959-60**

**පාඨමාලා—**

විද්‍යාලය අංශ දෙකක් යටතේ සංවිධානය වේ. එනම්—

(අ) **ප්‍රාවෘත්තීය පංති—**

(1) මෝටර් යාන්ත්‍රික විද්‍යාව,
(2) විදුලිය කම්බි සවි කිරීමේ වැඩ,
(3) ලෝහ වැඩ,
(4) වඩු වැඩ.

සම්පූර්ණ දිවාකාල මේ පංති අවුරුදු දෙකකට සීමිත වෙයි. ඉගැන්වීම සිංහල මාධ්‍යයෙනි. මේ පන්තිවල ඉගෙනීම ලැබ සාමාර්ථය ලැබූ ශිෂ්‍යයන්ට ඒ උගත් වෘත්තීන් සම්බන්ධ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයීය සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

(ආ) **වාණිජ විද්‍යා සහතික පත්‍ර පංති—**

(1) ගණන් තැබීම,
(2) ලඝු ලේඛනය හා ටයිප් ගැසීම.

සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය දෙකෙන් මේ පන්ති එකම කාල සීමාව තුළදී පැවැත්වෙයි. ඒවා සම්පූර්ණ දිවාකාල දෑවුරුදු පංතිය. පළමුවන අවුරුද්ද අවසානයේදී සමර්ථවූ ශිෂ්‍යයන්ට ගණන් තැබීම හෝ ලඝු ලේඛනය හා ටයිප් ගැසීම හෝ යන විෂයයෙන් වාණිජ විද්‍යා සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ. දෙවන අවුරුද්ද අවසානයේදී ගණන් තැබීම හෝ ලඝු ලේඛනය හා ටයිප් ගැසීම යන විෂයයෙන් උසස් වාණිජ විද්‍යා සහතික පත්‍රය ප්‍රදානය කෙරෙයි. යටකී විෂයයන් දෙකම ඉගෙනීමට උවමනා අයට එසේ කිරීමට හැකි වන සේ කාල සටහන පිළියෙල කරනු ලැබේ.

**ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම—**

ප්‍රාවෘත්තීය පන්ති පිරිමි ළමයින්ට පමණක් සීමා වෙයි. ඒ පන්තිවල ඉගෙනීමට ඉල්ලුම් පත්‍ර එවන ශිෂ්‍යයින් යටත් පිරිසෙයින් අවුරුද්දක් අට වැනි පංතියේ ඉගෙනීම ලැබූ බවට සහතිකයක්ද, එවැනි කාර්මික විෂයයන් හැදෑරීමට විශෙෂ හුරුකමක් ඇති බවටද සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. අයැදුම් කරුවන් 1959 මැයි මස පළමු වැනි දිනට වයස අවුරුදු දහ අටට (18) නොවැඩි විය යුතුයි.

සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන පළමුවන අවුරුද්දේ ගණන් තැබීමේ පංතියටත්, ලඝු ලේඛනය හා ටයිප් ගැසීමේ පංතියටත් බැඳීමට එවන ඉල්ලුම් පත්‍ර සලකා බලනුයේ සිංහල භාෂාව, සහ සිංහල සාහිත්‍යය විෂයයන් දෙකින්ම සම්මාන සාමාර්ථය සහිතව සිංහල භාෂාමය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් විෂයයන් 6කින් සමත් වී ඇති අයැදුම් කරුවන්ගෙන් පමණි.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පළමුවන අවුරුද්දේ ගණන් තැබීමේ පංතියටත් ලඝු ලේඛනය හා ටයිප් ගැසීමේ පංතියටත් බැඳීමට එවන ඉල්ලුම් පත්‍ර සලකා බලනුයේ සිංහල භාෂාවත් ඇතුළුව ඉංග්‍රීසි භාෂාමය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් විෂයයන් 6කින් සමත් වී ඇති අයැදුම් කරුවන්ගෙන් පමණි. ලඝු ලේඛනය, ගණන් තැබීම හා ටයිප් ගැසීම යන විෂයයන්ගෙන් එකකින් හෝ වැඩි ගණනකින් පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයට පෙනී සිටි හෝ සමර්ථවූ හෝ අයැදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම වාණිජ විද්‍යා සහතික පත්‍ර පංතිවලට ඇතුල්වීමට අවකාශ ඇත.

**ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍ර—**

ඉහත සඳහන් කවර පංතියකට හෝ ඇතුල්වීමට 1959 අප්‍රේල් 1 වැනිදා පස්වරු 4.30 දක්වා විද්‍යාලීය කාර්යාලයයෙන් ලබාගත හැකි නියමිත ඉල්ලුම් පත්‍රයේ ලියා එවිය යුතුයි. සියලුම ඉල්ලුම් පත් 1959 අප්‍රේල් 4 වැනි දින හෝ එයට පෙර ගාල්ලේ, කණිෂ්ඨ කාර්මික විද්‍යාලයාධිපති තැනට ලැබිය යුතුයි. ඉල්ලුම් පත්‍රයෙහි රුපියල් දෙකක මුද්දරයක් අලවා ඒ මත අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුයි. ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් උපදෙස් අනුව මනා පරෙස්සමින් ඉල්ලුම් පත්‍රය පිරවිය යුතුයි. අසම්පූර්ණ හෝ වැරදි ලෙස පුරවන ලද හෝ නියමිත වටිනා කමට අඩු මුද්දර අලවන ලද හෝ වැරදි ෆෝර්ම පාවිච්චි කරන ලද හෝ නියමිත දිනට පසුව ලැබී ඇති සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ඇල්. එච්. සුමනදාස,
වැඩබලන රෙජිස්ට්‍රාර්.

1959 මාර්තු මස 9 දින,
කොළඹ 10යේ ලංකා කාර්මික විද්‍යාලයීය
දෙපාර්තමේන්තුවේදීය.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයෙහි 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) සිමෙන්ති සැපයීම සඳහා 1959 ජූනි මස 16 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේ දී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 ජූනි මස 15 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර් කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මාර්තු 13 වැනි දින,
කොළඹදීය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) වාෂ්ප නළ, ගැල්වනයිස් වානේ තහඩු, මෘදු වානේ තහඩු, කාබන් වානේ තහඩු සහ මෘදු වානේ පොලු (පැතලි සහ රවුම්) සැපයීම සඳහා 1959 මාර්තු 31 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මාර්තු 30 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මාර්තු 13 වැනි දින,
කොළඹ දී ය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) 59.4.1 වැනිදා පටන් 59.9.30 වැනිදා තෙක් ගඟේ වැලි ආදිය සැපයීම සඳහා 1959 මාර්තු 24 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මාර්තු 23 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 මාර්තු 13 වැනි දින,
කොළඹ දී ය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### "කිච්" වර්ගයේ අන්නාසි මොටෙයියන් සැපයීම සහ ගෙනවිත් භාරදීම

කොළඹ—5, නාරාහේන්පිට ගොවිකම් කාර්යාලයෙහි කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැන විසින් කොටදෙනියාවේ වල්පිට ගොවිපල භාර කළමනාකාර තැන වෙත දිග අඟල් 14ටත් 18ටත් අතර වූ නීරෝගී "කිච්" වර්ගයේ අන්නාසි මොටෙයියන් 18,000 සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා වෙන් වශයෙන් ටැන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 3 වෙනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබෙයි.

2. කොළඹ—5, නාරාහේන්පිට, ගොවිකම් කාර්යාලයෙහි, කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා සීල් තබා "කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැන, ගොවිකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ—5" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "කිච් වර්ගයේ අන්නාසි මොටෙයියන් සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න, ලියා එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතකින් යුක්ත විය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ ඉහත සඳහන් ද්‍රව්‍යය සඳහා ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කොළඹ—5, නාරාහේන්පිට, ගොවිකම් කාර්යාලයේ, කොළඹ දිස්ත්‍රික්කය භාර පරිපාලන නිලධාරි තැනට ඒවා ගෙනවිත් අතින්ම භාර දිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "'කිච්' වර්ගයේ අන්නාසි මොටෙයියන් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

ලියාපදිංචි කළ තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුනු බව ඒවා විවෘත කරන දිනයේ දීම සියලුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්යාලයෙහි පරිපාලන නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දින යටකී වේලාවේදී කොළඹ 5, නාරාහේන්පිට, ගොවිකම් කාර්යාලයෙහි පරිපාලන නිලධාරිතැන විසින් ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුය.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන්වූද පිළිගනු ලැබුවාවූද, දේවල මුළු වටිනාකමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනුලැබෙන්නේ මෙම කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටුනොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ගණයට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා දැරිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ටෙන්ඩර් පත්‍රයන් ප්‍රතික්‍ෂේප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන සතුව ඇත.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් එම ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කාර්‍ය්‍යයන් සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදිය යුතුවාත් හැර මෙම සැපයීම සඳහා ටෙන්ඩර් කිරීමෙහි හැකියාව ඇත්තේද "ලාංකික" වන හවතුන්ට හා වෙළඳ සමාගම් වලට පමණකි. "ලාංකික" යන වචනයෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවෙහි පුරවැසි භාවය ලත් බවය.

13. කොන්ත්‍රාත්කරු හට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කොට ඇති ලිපියොමුවකට තැපෑලෙන් යවනු ලැබුවහොත් ඔහු අතටම එවැන්න භාර දුන්නාක් කොට සැලකේ.

14. වර්‍ෂ 1934 රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනතෙහි 117 වෙනි පරිච්ඡෙදය යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලේඛුම් පත්‍ර ගැණ වගකීමෙන් කොන්ත්‍රාත් කරු ආණ්ඩුව නිදහස් කටයුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයැයි හැගෙන යම් කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැණ එරෙහිවීමෙහි හෝ ඕනෑම කම්කරුවෙක් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමෙහි බලය රජය සතුව ඇත.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ රජයේ ලැයිස්තුවට තනි තනිව හෝ එකී ලැයිස්තුවෙහි නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත් වූ, හෝ තමාට සැහේයැයි පෙනීයන හේතුන් ප්‍රකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධවන කවරෙකු සමඟ හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබෙයි.

17. වැඩි විස්තර සඳහා කොළඹ 5, නාරාහේන්පිට කෘෂිකර්ම කාර්‍ය්‍යාලයෙහි පරිපාලන නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි.

ඇම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1959 මාර්තු 3 වැනි දින,
පේරාදෙනියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුර හා කට ලෙඩ සඳහා එන්නත් සාරය සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තුමා විසින්, පහත සඳහන් දේවල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු 27 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ :—

හරකුන්ගේ කුර හා කට ලෙඩ සඳහා ඕ. ඒ. සී. වර්ගය අඩංගු එන්නත් සාරය 3,000ක් සැපයීම.

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ පරිපාලන නිලධාරි තැනගෙන්, පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපතිතුමා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාතීමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "කුර හා කට ලෙඩ සඳහා එන්නත් සාරය සැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කටයුතු ලිපිකරුට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "කුර හා කට ලෙඩ සඳහා එන්නත් සාරය පැපයීමේ ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු පේරාණේියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරීය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත් කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට පුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනි යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ තැනගෙන් දැනගත හැක.

18. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට සති දෙකක් ඇතුළත යථෝක්ත එන්නත් සාරය සැපයිය යුතුය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1959 මාර්තු මස 6 වැනිදා,
පේරාදෙණියේ දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

### උඩුවිල්හි පුංගව මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැන විසින්, පහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් 3 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

(1) ලී කනු 12ක් අඩි 3ක් ගැඹුරට කොන්ක්‍රීට් දමා සිටවීම ;

(2) පොල් අතු 800 කින් වහලවල් දෙකක් වැහීම—අගුවල මානය මෙසේ ය : 31′×22″ හා 23′×15″ ;

(3) 180′×3½′ කම්බිදැල් සවිකිරීම ;

(4) සලාක බඩු ගබඩාවේ කම්බිදැල් සවි කළාට පසු දෙර රාමුව ගලවා නැවත සවිකිරීම ;

(5) 184′×5′ උස පොල් අතු වැටක් දැමීම.

2. යාපනේ, කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, යාපනය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි "උඩුවිල්හි පුංගව මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් අනු පිටපතකින් යුක්ත විය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුනේ රු. 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "උඩුවිල්හි පුංගව මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල අළුත්වැඩියාකිරීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත මේ ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලා වේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී යාපනේ කෘෂිකර්ම කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මූළ වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934ඡේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

18. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් පත්‍රය අත්සන් කළ දින සිට තුන් මසක් ඇතුළත යථෝක්ත කාර්ය අවසන් කළ යුතුය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1959 මාර්තු මස 3 වැනිදා,
පේරාදෙණියේදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කිලිනොච්චි ගොවිපොලේ පාරවල් අළුත්වැඩියා කිරීම හා බොරළු ගල් දැමීම

යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින්, පහත සඳහන් සේවා සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

(1) පාරෙ දෙපැත්තේ අඩි 3ක් පළල, අඟල් 8ක් ගැඹුර කාණු කැපීම.

(2) අඩි 8ක් පළල උන්දම හැඩයක් ගත යුතු පාරේ බොරළු ගල් දමා අතුරා බර ගල් රෝලෙන් රෝල් කළ යුතුය. රෝල් කළාට පසු බොරළු ගල් තට්ටුව මැද අඟල් 4කට නොඅඩු හා දෙපැත්තේ අඟල් 2කට නොඅඩු විය යුතුය.

2. යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝරම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කාර්යාලය, යාපනය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කෙළවරෙහි කිලිනොච්චි ගොවිපොලේ පාරවල් අළුත් වැඩියා කිරීම හා ගල් බොරළු දැමීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් අනු පිටපතකින්ද යුක්ත විය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "කිලිනොච්චි ගොවිපොලේ පාරවල් අළුත්වැඩියා කිරීම හා බොරළු ගල් දැමීම සඳහා ටෙන්ඩර්" යන්න

ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් /නු යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී යාපනේ කෘෂිකම් කායඝීලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකම් අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කායඝීලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

18. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් පත්‍රය අත්සන් කළ දින සිට තුන් මසක් ඇතුළත යථෝක්ත කායඝීය අවසන් කළ යුතුය.

ඇම්. ඈෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1959 මාර්තු මස 3 වැනිද,
පේරාදෙණියේදීය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### බණ්ඩාරවෙල පී. ඩබ්ලිව්. ඩී. "ඒ" කවටි ගෙවල් 3 ක් සෑදීම

මගේ 1959 පෙබරවාරි මස 2 වැනි දින දතමින්, 1959 පෙබරවාරි 13 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ බණ්ඩාරවෙල පී. ඩබ්ලිව්. ඩී. "ඒ" ගෙවල් 3ක් සෑදීම පිණිස ටැන්ඩර් පත්‍ර කැඳවා පළ කරන්නට යෙදුන දැන්වීම මෙයින් අවලංගු කරමි.

ඇම්. ඈෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂක.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### කිලිනොච්චියේ පී. ඩබ්ලිව්. ඩී. ඒ කවටි ගෙවල් 3 ක් සෑදීම

මගේ 1959 පෙබරවාරි මස 2 වැනි දින දතමින්, 1959 පෙබරවාරි මස 13 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ කිලිනොච්චියේ පී. ඩබ්ලිව්. ඩී. ඒ ගෙවල් 3 ක් සෑදීම පිණිස ටැන්ඩර් පත්‍ර කැඳවා පළ කරන්නට යෙදුන දැන්වීම මෙයින් අවලංගු කරමි.

ඇම්. ඈෆ්. චන්ද්‍රරත්න
කෘෂිකම් අධ්‍යක්ෂ.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### වාගොල්ලේ පී. ඩබ්ලිව් ඩී. ඒ කවටි ගෙවල් 3 ක් සෑදීම

මගේ 1959 පෙබරවාරි 2 වැනි දින දතමින්, 1959 පෙබරවාරි මස 13 වැනි දින ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ වාගොල්ලේ පී. ඩබ්ලිව්. ඩී. "ඒ" ගෙවල් 3 ක් සෑදීම පිණිස ටැන්ඩර් පත්‍ර කැඳවා පළකරන්නට යෙදුණ දැන්වීම මෙයින් අවලංගු කරමි.

ඇම්. ඈෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### හම්බන්තොට කෘෂිකම් කාර්යාලය තුළ කළ යුතු වැඩ

හම්බන්තොට කෘෂිකම් කාර්යාලයේ පාලන් නිලධාරි තැන විසින් හම්බන්තොට කෘෂිකම් කාර්යාලය ඇතුළත කළ යුතු පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

(1) අනුමත කරන ලද ලී වලින් වර්ග අඩි 231ක ප්‍රමාණයක වීදුරු රාමු ගසා කාමර වෙන් කිරීම.

(2) අනුමත කරන ලද ලී වලින් වර්ග අඩි 91ක වීදුරු පැනෙල් දොරවල් සාදා සවි කිරීම.

(3) අඩි 10ක් උස්වූ තනි ගඩොලින් බඳින ලද බිත්තිවලට සිලිම දක්වා කුළුනු තුනක් සිමෙන්තියෙන් බැඳීම.

(4) වර්ග ප්‍රමාණය අඟල් 9ක්වූ උස අඩි 10ක්වූ කණු තුනක් (3) සිමෙන්තියෙන් බැඳීම.

2. හම්බන්තොට කෘෂිකම් කාර්යාලයේ පාලන නිලධාරි තැන ගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පාලන නිලධාරි තැන, කෘෂිකම් කාර්යාලය, හම්බන්තොට" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "කෘෂිකම් කාර්යාලය තුළ කළ යුතු වැඩ සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් හම්බන්තොට කෘෂිකම් කාර්යාලයේ පාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "කෘෂිකම් කාර්යාලය තුළ කළ යුතු වැඩ සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු හම්බන්තොට කෘෂිකම් කාර්යාලයේ පාලක නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුය.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී හම්බන්තොට කෘෂිකම් කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

7. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයක් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවා වූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. 1934ජේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3ට වත් වෙනස් නොවන සපිර ඒවා විය යුතුයි.

18. වැඩි විස්තර හම්බන්තොට කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් දැන ගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන.

1959 මාර්තු 5 දින,
පේරාදෙණියේ දී ය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොළොන්නරුවේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දුම්කොළ උදුන් "බාන්ස්" දෙකක් සෑදීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් පොළොන්නරුවේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දුම්කොළ උදුන් (බාන්ස්) දෙකක් (2) සෑදීම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන අනුපිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති තුමා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන්න එහි ලියා එහිම මුදුනේ වම් කෙළවරේ "පොළොන්නරුවේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දුම්කොළ උදුන් (බාන්ස්) සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුයි.

3. මෙම ගොඩනැගිලි සඳහා රුපියල් 15,000/-කට වඩා ආණ්ඩුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1959 මාර්තු මස 27 දින දවල් 12 වනතෙක් එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ රුපියල් 25/-ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කටයුතු ලිපිකරුට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලනලද කවරයෙහි "පොළොන්නරුවේ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ දුම්කොළ උදුන් (බාන්ස්) සෑදීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයෙහි යටකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් පොළොන්නරුවේ කෘෂිකර්ම කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් මේ ගොඩනැගිලි සම්බන්ධව ප්ලෑන, දිග පළල යනාදී පිළිබඳ වැඩි විස්තර ලබාගත යුතුයි. සෑම ටෙන්ඩර් කරුවෙක්ම මේ ගොඩනැගිලි සෑදීමට අදහස් කරන ස්ථාන පරීක්ෂාකර බලා ටෙන්ඩර් පත්‍ර යැවුවොත් යෙහෙකි.

9. දුම්කොළ උදුන් (බාන්ස්) දෙක සාදා නිමකර ඒවා 1959 මැයි මස 25 වෙනි දිනට පෙර භාරදිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද පිළිගනු ලැබුවා වූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂක තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇපය රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

11. ටෙන්ඩර් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

12. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

13. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනු ලැබේ.

14. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් යන්නයි.

15. කොන්ත්‍රාත්කාරයාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

16. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

17. වැඩට ගැනීමට නුසුදුසු යැයි කල්පනා කරණු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යැයි පෙනී යන හේතු පිට කෘෂිකම් අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

19. වැඩි විස්තර පොළොන්නරුවේ, කෘෂිකම් කාර්යාලයේ, පරිපාලක නිලධාරි තැනගෙන් හෝ ගොවිපලේ කළමනාකාර තැනගෙන් හෝ දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂක තැන.

1959 මාර්තු 3 වැනි දින,
පේරාදෙණියේදී ය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

**රිදියගම කපු වැවීමේ ව්‍යාපාරය—කැලෑ ශුද්ධ කිරීම සහ මුල් ගැලවීම**

1. කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තුමා විසින් 1959 අප්‍රේල් මස 3 වැනි සිකුරාද සවස 2.30 වන තෙක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ ආදායම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයේ වලවේ ගම්මුලාදෑනි තැනගේ කොටසෙහි රිදියගම සත්ව ගොවිපොළට යාබද අක්කර 600 (හය සියයක) පමණ ප්‍රදේශයක කැලේ ශුද්ධ කිරීම සහ එහි මුල් ගැලවීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පෝර්ම කොළ පේරාදෙණියේ කෘෂිකම් අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගෙන, එම පෝර්මයේ සෑම හිස් තැනක්ම පුරවා ටෙන්ඩර් පත්‍රයේ මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම ලියුම් කවර දෙකක බහා එම ලියුම් කවර දෙකේ මුල් පිටපත සහ අනුපිටපත යයි ලියා එම ලියුම් කවර දෙක සුරක්ෂිතව සීල් තබා නැවත එක ලියුම් කවරයක බහා සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකම් අමාත්‍යාංශය, කොළඹ 2 යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "රිදියගම කපු වැවීමේ ව්‍යාපාරයේ කැලෑ ශුද්ධ කිරීම සහ මුල් ඉදිරීම සඳහා ටෙන්ඩර්" යි ලියා එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැති නම් ඒවා ලියාපදිංචි කර තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි කර තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැනවූ කෘෂිකම් හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට භාරදිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "රිදියගම් කපු වැවීමේ ව්‍යාපාරයේ කැලෑ ශුද්ධ කිරීම සහ මුල් ඉදිරීම පිණිස ටෙන්ඩර් පත්‍රය" ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කර තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නොලැබුනේ නම් ඒ ගැන කොළඹ යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි,

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියම දින යට කී වේලාවට කොළඹ, යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේදී ඒවා විවෘත කරනු ලැබේ. කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගේ අවසරය ඇතිව ටෙන්ඩර්කරුවන්ට ඔවුන් ඉදිරිපත් කළ ටෙන්ඩර් වල අනුපිටපත් පරීක්ෂා කිරීමට බලය ඇත.

6. රු. 1,50,000කට වඩා වටිනා වැඩ කිරීම පිණිස ආණ්ඩුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 3.4.59 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩරයක් වෙනුවෙන් කච්චේරියක හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ රු. 500ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ.

7. නියමිත පෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති, කිසිම ටෙන්ඩර පත්‍රයක් නියම ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් සහ ගණන් පැහැදිළි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතු වේ.

8. ටෙන්ඩර් කරුවන් විසින් වැඩෙහි සැලැස්ම සහ ටෙන්ඩරයේ කොන්දේසි මනාලෙස ඉගෙන, වැඩ කළ යුතු ස්ථානයට ගොස් එතැන පරීක්ෂා කර බලා, එම ප්‍රදේශයේ තත්ත්වය, පළාතේ කම්කරුවන් ඇති නැති බව, ඔවුන්ට ගෙවිය යුතු පඩි ප්‍රමාණයන්, වැඩ කළ යුතු ස්ථානයට යාමට හැකි ගමන් පහසුකම් ආදී ඔවුන්ගේ ටෙන්ඩරය කෙරෙහි බලපාන සෑම කරුනක් ගැනම නියම අවබෝධයක් ඇතිව ටෙන්ඩර ඉදිරිපත් කළා ලෙස සලකනවා ඇත.

9. කැලෑ ශුද්ධ කිරීම සහ මුල් ඉදිරීම පිණිස අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ අනිකුත් බඩු පිට රටින් ගෙන්වීමට සෑම ටෙන්ඩර් කරුවෙක්ම අදහස් කරන්නෙහි නම්, එසේ ගෙන්වීමට යන බඩු වල සහ උපකරණ වල ලැයිස්තුවක් "සී. අයි. ඇෆ්" මිළ ගණන්ද සහිතව ටෙන්ඩර පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි.

10. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ, දින සිට සති හයක් යන තුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි. ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බව දැනුම් දුන් දින සිට මාස පහක් (5)ක් ඇතුළතදී අක්කර (600) හය සියයේ කැලෑ ශුද්ධ කිරීම සහ මුල් ඉදිරීම අවසාන කළ යුතුයි. ටෙන්ඩර් කරුට එසේ කළ නොහැකි වුවහොත් ප්‍රමාද කිරීමේ වන්දි වශයෙන් නොව, අලාභ වශයෙන් ශුද්ධ නොකළ සහ මුල් නොඉදුරූ සෑම අක්කරයකටම රු. 150 බැගින් ගෙවීමට සිදුවෙනවා ඇත.

11. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා දස දිනක් ඇතුළත පොරොන්දු පත්‍රයකට ඇතුළත්වීමට සූදානම් විය යුතුයි. කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනගේ නමින්, ටෙන්ඩර කරන ලද මුදලින් සියයට දෙකහමාරක (සියයට $2\frac{1}{2}$) මුදලක්, ආණ්ඩුව පිළිගත් බැංකුවක ඇප මුදල් වශයෙන් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි නිම වූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයින්ගේ ලැයිස්තුවට ඇතුළත් වනවාද ඇත. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනා කම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් සියයට සියයක්ම නුපුහුණු ලාංකික කම්කරුවන්ද, සියයට හැත්තෑ පහක් පුහුණුවූ ලාංකික කම්කරුවන්ද වැඩෙහි යෙදවිය යුතුයි. මෙම ප්‍රමාණයේ යම්කිසි වෙනසක් වුවමනා කරන්නෙහි නම්, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනගේ අනුමැතිය ලබාගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි. පිටරටින් පුහුණු කම්කරුවන් ගෙන්වන්නෙහි නම් එය පත්කරනු ලැබූ ටෙන්ඩර් කරුවා ගේ වගකීම පිට කළ යුතුයි.

13. තමාගේ යම්කිසි සේවකයෙකුගේ හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කැලේ ශුද්ධ කරන ප්‍රදේශයේ ලී වලට ගත හැකි ගස් තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හෝ කැලෑ සංරක්ෂක ට වුවමනා කරන එවැනි ගස්, ඉරීමට යන ගාස්තු ඔහුත් සමග තීරණයකට බැස ගත් පසු සපයා දීම පිණිස කොන්ත්‍රාත් කරු විසින් බැඳී සිටිය යුතුයි,

15. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු විසින් ඇප කරුවන් දෙදෙනෙකු සොයා ගෙන ඔහුගේ වියදමින් ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇප කරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නමක් සමඟ නම ඇතුලුවූ හෝ තමාට සෑහේයයි පෙනී යන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුව හොත් එසේත් නැතහොත් ඔහු ලියා දී තිබෙන ස්ථානයට ගෙන ගොස් දුන්නහොත් ඔහුට භාර දුන්නා කොට සැළකිය යුතුයි. කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගෙන් ලියවිල්ලකින් ලබාගත් බලය නැතිව මෙම කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ උප කොන්ත්‍රාත්තුවක් සේ දීමට අවසර නැත.

18. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට ම තබාගනු ලැබේ.

19. ඉහත සඳහන් වැඩ කොටස අඩු කිරීම දෙපාර්තමේන්තුවේ යහපත පිණිස වේ යයි කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට පෙනී යාම නිසා කොන්ත්‍රාත්තුවේ සඳහන් ප්‍රමාණයටම ඒ වැඩය නොකිරීම ගැන කිසිම වන්දි මුදලක් ආණ්ඩුවෙන් ඉල්ලීමට කොන්ත්‍රාත්කරුවාට හිමිකමක් නොතිබිය යුතුයි.

20. කළ යුතු වැඩය සතුටුදායක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට තබා ගනු ලැබේ.

21. යම්කිසි ටෙන්ඩර් හෝ සියලු ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් හෝ ටෙන්ඩර් පත්‍ර පිළිගැනීමේත් බලය ආණ්ඩුව වෙත තබා ගනී.

22. මේ සම්බන්ධව වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තැනගෙන් ඉල්ලුම් කළ විට ලැබේ. එම ඉල්ලුම් පත්‍ර ඔහුගේ පෞද්ගලික ලිපිනයට නොව රාජකාරි ලිපිනයට එවිය යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ,

පේරාදෙණිය.
1959.3.9

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**මහනුවර දිස්ත්‍රික්කයේ මිනිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ ගස් කැපීම, කුට්ටි කිරීම සහ කොටන් ගෙන යෑම**

මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

(1) මිනිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවර්ධනය සඳහා වෙන්කර ඇති ප්‍රදේශයේ ගස් කැපීම, කුට්ටි කිරීම සහ එම කොටන් හසලක ඇති ලී මෝල කරා ගෙන යාම.

(2) දෙපාර්තමේන්තුවේ කම්කරුවන් විසින් කපා, කොටන් කරන ලද ගස් 200ක පමණ කොටන් හසලක ලී මෝල කරා ගෙන යාම.

4. 59.3.24 වැනි දින දවල් 12 දක්වා මහනුවර ඉඩම් සංවර්ධන තැනගේ කායඝාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි.

1959.3.31 දින පෙරවරු 10.30ට ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායඝාලයේදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට මේ අවස්ථාවේ දී පැමිණ සිටිය හැක. මේ සම්බන්ධව සම්පූර්ණ විස්තර මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කායඝාලයෙන් ලබාගත හැක.

දයානන්ද හෙට්ටිආරච්චි,
ඉඩම් සංවර්ධන නිලධාරිතැන.

1959 පෙබරවාරි 25 වැනි දින,
මහනුවර ඉ. ස. කායඝාලයේ දී ය.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ ගොඩනැගිලි සඳහා බඩුබාහිරාදිය සැපයීම**

මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරි තුමා විසින් මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ ඇල දික්කිරීමේ ව්‍යාපාරයේ ගොඩනැගිලි සෑදීම සඳහා අවශ්‍ය පහත සඳහන් බඩුබාහිරාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959.3.31 දින දක්වා භාර ගනු ලැබේ :—

(1) පොල් අතු (ඉරු දෙක බැගින්, වියන ලද ඒවා දිගින් අඩි 7ටත් පළලින් අඟල් 9ටත් අඩු නොවිය යුතුයි.)

(2) කළුගල් (අඟල් 6×9 ප්‍රමාණය.)

(3) ගඩොල් ($4\frac{1}{4}\times2\frac{3}{4}\times8\frac{3}{4}$.)

(4) අළුහුණු (බුසල රාත්තල් 44ට අඩු නොවිය යුතුයි.)

(5) තම්බාපු හුණු

(6) කළුගල් $\frac{3}{4}$"

(7) කළුගල් 1"

(8) කළුගල් 2"

1959.3.24 දක්වා මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කායඝාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. කච්චේරියක රු. 25ක ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කොට ටෙන්ඩර් පත්‍රිකා ලබාගත යුතුයි.

1959.3.31 වෙනි දින පෙරවරු 10ට ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායඝාලයේදී ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

මේ ගැන සම්පූර්ණ විස්තර මහනුවර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කායඝාලයෙන් ලබාගත හැක.

දයානන්ද හෙට්ටිආරච්චි,
ඉඩම් සංවර්ධන නිලධාරිතැන.

1959 පෙබරවාරි 25 වෙනි දින,
ඉඩම් සංවර්ධන කායඝාලය, මහනුවර.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහගල්වැව, රත්නපුර දිස්ත්‍රික්කයේ චන්ද්‍රිකාවැව, මාතර දිස්ත්‍රික්කයේ දංගල, කලුබෝවිටියාන හා දෙරංගල ගාලු දිස්ත්‍රික්කයේ හල්විටිගල යන ව්‍යාපාරයනට ගොඩනැගිලි උපකරණ සැපයීම**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහගල්වැව, රත්නපුර දිස්ත්‍රික්කයේ චන්ද්‍රිකාවැව, මාතර දිස්ත්‍රික්කයේ දංගල, කළුබෝවිටියාන හා දෙරංගල සහ ගාලු දිස්ත්‍රික්කයේ හල්විටිගල යන ව්‍යාපාරයන්ට පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා මිල ගණන් සඳහන් ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 27 වැනි දින පෙරවරු 10 දක්වා මාතර ඉඩම් සංවර්ධන නිලධාරි තැන විසින් භාරගනු ලැබේ :—

(1) පොල් අතු : දිග අඩි 7ටත් පළල අඟල් 12ටත් අඩු නොවිය යුතුයි. (1,000 ගණනින්).

(2) හුණු අළු : බුසල් ගණනින් (බුසල් එකක් රා. 44 කට අඩු නොවිය යුතුයි).

(3) තම්බාපු හුණු : බුසල් ගණනින්.

(4) කළුගල් : අඟල් 6" × 9" කියුබ් ගණනින්.

(5) තලාපු කළුගල් : $\frac{3}{4}$ කියුබ් ගණනින්.

(6) තලාපු කළුගල් : අඟල් 1ක කියුබ් ගණනින්.

(7) තලාපු කගල් : අඟල් 2ක කියුබ් ගණනින්.

(8) පිළිස්සූ ගඩොල් : 1,000 ගණනින්. (අඟල් $8\frac{3}{4}\times4\frac{1}{4}\times2\frac{3}{4}$ ප්‍රමාණය විය යුතුයි. පෝරණුව වැඩ පොලට සැතපුම් 5කට වඩා ඈත් නොවිය යුතුයි.)

2. මිළ ගණන් පහත දැක්වෙන අයුරු වෙන වෙනම සඳහන් කළ යුතුයි :—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් වත්ත, **පෝරණුව, ගල්වල අසලදීම භාරදීම සඳහා මිළ. පිහිටා ඇති ස්ථානය හා ව්‍යාපාරයේ සිට ඇති දුරත් සඳහන් කළ යුතුයි.**

(ආ) ව්‍යාපාරයනට භාරදීමට මිළ.

3. 1959 මාර්තු මස 25 දින දහවල් 12 දක්වා මාතර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබා ගත හැකි පෝරමවල ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට අනු පිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. එක් එක් ව්‍යාපාරයකට එක් එක් ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රයකට රුපියල් පණහක් (රු. 50) බැගින් ඇප මුදල් මාතර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ

කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර ලබාගත හැකිය.

4. 1959 මාර්තු මස 27 වැනි දින පෙරවරු 10.30ට මාතර ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ඉල්ලුම් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ අවස්ථාවේදී පැමිණ සිටිය හැකිය.

5. මේ සඳහා වැඩි විස්තර මාතර ඉඩම් සංවර්ධන නිලධාරි තැන ගෙන් ලබාගත හැකිය.

ජේ. එක්ස්. ආර්. ඇන්තනි පිල්ලේ,
ඉඩම් සංවර්ධන නිලධාරි, මාතර.

1959 පෙබරවාරි 24 වන දින,
මාතර ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රුපියල් 25,000 හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් බෝමිරියේ ජල ගැලීම් වැලැක්වීමේ ව්‍යාපාරයේ ගංවතුරින් කැඩී බිඳී ගිය තැන් අලුත් වැඩියා කිරීම සඳහා 1959 අප්‍රේල් මස 2 වෙනි බ්‍රහස්පතින්දා උදේ 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. බස්නාහිර කොඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉන්ජිනේරු තුමා, කොටා රෝඩ්, කොළඹ 8.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ කොළඹ උප ප්‍රාදේශීය වාරි මාර්ග කාර්යාලයෙන් ලබාගත හැක. එම කාර්යාලයෙන්ම වැඩි විස්තර සහ සැලැස්ම බලා ගත හැක.

කොළඹ 9 යේ වේලුවන පාරේ පිහිටි වාරි මාර්ග දෙපාර්තමේන්තු කාර්යාලයෙන් හෝ ඕනෑම කච්චේරියකින් ටැන්ඩර් පත්‍රයක් වෙනු වෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් රුපියල් 25,000ක් හෝ ඊට වැඩි වාරි මාර්ග දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචි බව ඔප්පු කිරීමට හැකි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 1959 මාර්තු මස 31 වෙනි අඟහරුවාදා සවස 4.30 වන තෙක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුය.

ජේ. එච්. හෝස්මන්,
කොළඹ උපප්‍රාදේශීය වාරිමාර්ග
ඉන්ජිනේරු තැන.

වාරි මාර්ග ඉන්ජිනේරුතුමාගේ කාර්යාලය,
වේලුවන පාර, කොළඹ 9.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉජිනේරු තැන විසින් 1959 අප්‍රියෙල් මස 3 වෙනි දින 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ කළුගඟ ගංවතුර වැලැක්වීමේ ව්‍යාපාර යේ හිකවු ඇල බෙත්මේ වැඩ සඳහා රු. 50,000කට හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සිල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැන විසින් 1959 මාර්තු මස 30 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබාගැනීමේදී රු. 50ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරි මාර්ග අධ්‍යක්‍ෂ තුමා නමට ගත් රු. 50ක මුදල් ඕඩරයක් ඉදිප්පත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

වැඩි විස්තර කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැන.

වාරි මාර්ග කාර්යාලය.
කළුතර, 1959. 3. 5.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ කොටා රෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාර්ග ඉජිනේරු තැන විසින් 1959 අප්‍රියෙල් මස 7 වෙනි දින 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ මිගමු මූනමල්වත්ත කරදිය වැලැක් වීමේ ව්‍යාපාරයේ ඕවර්සියර් නිවාසයක් තැනීම සඳහා රු. 20,000කට හෝ ඊට වැඩි ගණනකට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සිල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැන විසින් 1959 මාර්තු මස 28 වෙනි දින සිට අප්‍රේල් 3 වෙනි දින දක්වා (දෙදිනම ඇතුළුව) ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබාගැනීමේ දී රු. 25 ක ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතත් හෝ වාරි මාර්ග අධ්‍යක්‍ෂක තුමා නමට ගත් රු. 25 ක මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

වැඩි විස්තර කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර උප ප්‍රාදේශීය වාරි මාර්ග නිලධාරි තැන.

වාරි මාර්ග කාර්යාලය.
කළුතර, 1959. 3. 7.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් ත්‍රිකුණාමලයේ වාරිමාර්ග කාර්යාලයේදී කන්තලේ ස්ථිර ඕවර්සියර්වරුන්ගේ නිවාසයක් සෑදීම සඳහා 1959 මාර්තු 31 වෙනි අඟහරුවාද උදේ 9.30 වන තුරු රු. 20,000 කට සහ ඊට වැඩි ගණනකට ටැන්ඩර් බාරගනු ලැබේ.
ටැන්ඩර් බාරගනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ රෙජිස්ටර්වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණය.

ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුත්තේ පිටපත් දෙකකින්ය. ටැන්ඩර් පත්‍රත් සියළු විස්තරත් කන්තලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් ලබා ගත හැක. ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු 24 වෙනි දින සිට 1959 මාර්තු 27 වෙනිදා දක්වා නිකුත් කරනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කච්චේරියේ හෝ කන්තලේ වාර්මාර්ග කාර්යාලයේ රු. 25ක් තැන්පත් කර ගත් රිසිට්පතක් ඉදිරි පත් කරන දෙපාර්තමේන්තුවේ රෙජිස්ටර් කොන්ත්‍රාත් කරුවන්ට පමණය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 මාර්තු මස 25වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

(1) පැත්නුම සඳහා පලාපු ගල් 6,000ක් පමණ සැපයීම.
(2) හක්වටුනා ඔය උපකොට්ඨාශයේ බඩු ඇදීම.
(3) කාර්මික සහකාර නිලධාරීන් සඳහා අර්ධ ස්ථිර නිවාස 2ක් ගොඩනැගීම.

2. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩවලට අදාළ සියළුම තොරතුරු එම වාරිමාර්ග ඉංජි නේරු තැනගෙන් විමසා දැනගතහැකි අතර සිතියම් ආදිය ඔහුගේ කායඝිලයේදී පරීක්ෂා කළ හැක.

3. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 මාර්තු 23වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත්කරනු ලැබේ. ඒ ඒ වැඩ සඳහා මෙම පෝර්ම ලබාගත හැක්කේ පහත සඳහන් ගණන් වලට හෝ ඊට වැඩි ගණන් වලට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත්කරුවනට පමණි:—

ඉහත සඳහන් 1 වැඩය සඳහා රු. 10,000,
ඉහත සඳහන් දෙවෙනි වැඩය සඳහා රු. 10,000,
ඉහත සඳහන් 3වෙනි වැඩය සඳහා රු. 20,000

මෙම පෝර්ම ලබාගැනීමේදී රු. 25ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. වාරිමාර්ග අධ්‍යක්‍ෂක වෙනු වෙන් මෙම මුදල කච්චේරියේ තැන්පත් කළ හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන.
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

වාරිමාර්ග කායඝිලය,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය,
මකුල්පොත.

## ආහාර දෙපාර්තමේන්තුව

වෂී 1959ක්වූ අප්‍රේල් මස 1වෙනි දින සිට 1959ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1959ක්වූ මාර්තු මස 26වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ යුනියන් පෙදෙසේ (අංක 564 දරණ තැපැල් පෙට්ටිය) ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

**සේවය.**—කොළඹ වරායේ වාප්පුවල සිට චාමර්ස් ධාන්‍යාගාරයේ වැල්ලවත්තේ, මාලිගාවත්තේ, කොලොන්නාවේ, පැපිලියානේ, මැනිං වෙළඳ හලේ සහ වේයන්ගොඩ ආහාර කොමසාරිස්ගේ ගබඩා වලට ආහාර ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් හාල්, පිටි සහ සීනි) ලොරිවලින් ගෙන යෑම.

මිටියක් මුළු දුර ප්‍රමාණය ගෙන යෑම සඳහා හා හැතැප්මකට ටොන් එකකට අය කරන ගාස්තු ප්‍රමාණය වෙන වෙනම සඳහන් කළ යුතු වේ. හාල් සාමාන්‍යයෙන් රාත්තල් 160වේ සහ 224ජේ මිටිවලින් යුක්ත වේ. පිටි මිටියක සාමාන්‍ය බර රාත්තල් 150ක් වේ. යටත් පිරිසෙයින් කුලී ලොරි 10ක් හිමි එසේම කුලී ලොරි 10ක් සේවය සඳහා සැපයිය හැකි, ප්‍රවාහණ කටයුතුවල නියුක්ත වූවන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ. නියම කරනු ලබන පරිදි අතිරේක කුලී ලොරි සැපයීමටද ටෙන්ඩර්කරුට හැකි විය යුතුය. තමන්ට ලබා ගත හැකි රථවාහන වලින්ම කොන්ත්‍රාත්තුව ඉටු කිරීමටද ටෙන්ඩර් කරුවන්ට හැකිවිය යුතුය.

කොළඹ යුනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාල යෙන් 1959ක්වූ මාර්තු මස 26වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 100ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළයුතු වත් හැර විස්තර ප්‍රකාශනයේ 4 (ii) සහ (iii) දරණ ඡේදයන්හි සඳහන් ලියවිලිද ඉදිරිපත් කළ යුතු වේ. මෙම විස්තර ප්‍රකාශනයද අමතර විස්තරද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

330, යුනියන් පෙදෙස,
කොළඹ 2,
1959ක්වූ මාර්තු මස 6 දින දී ය.

---

## ආහාර දෙපාර්තමේන්තුව

### හාල් විකිණීම

පහත සඳහන් හාල් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 අප්‍රියෙල් 1 වෙනි දින පස්වරු 2.30 තෙක් ලාංකික පුරවැසියන්ගෙන් භාරගනු ලැබේ. ස්පාඤ්ඤයේ සහ මිසරයේ හාල් ටොන් 543 ක් පමණ.

මෙම හාල් මෙරටේ විකිණීමට පුද්ගලික වෙළඳුන්ට ඉඩ දෙන්නේ ඒ සඳහා විශෙෂයෙන් ලියා පදිංචිවූ විටය. එහෙත් තෙමසක් තුළ හාල් විකිණිය යුතුවේ. ගැනුම් කරුවන්ට අවශ්‍ය නම් හාල් පිටරට යැවීම සඳහා බලපත්‍ර දෙනු ලැබේ.

ටෙන්ඩර් භාරගන්නේ එක ගොඩක ටොන් 100ක් ඇති ගොඩවල් 5ක් හා ටොන් 43ක් ඇති එක ගොඩක්ද සඳහා වේ. ටෙන්ඩර් කරන මිලට අමතර වශයෙන් පැටවීමේ ගාස්තුව ලෙස හොණ්ඩරය කට ශත 5ක් අය කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගෙන සති තුනක් ඇතුළත මුදල් ගෙවා හාල් ඉවත් කරගත යුතුය.

දෙපාර්තමේන්තුවේ රුපියල් 250ක් තැන්පත් කොට ලබා ගන්නා පෝර්මවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුයි. පිළිනොගත් ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. වැඩි විස්තර මගෙන් ලබාගත හැකිය.

ජේ. එච්. ලැනරෝල්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1959 මාර්තු 10 දින,
කොළඹදීය.

---

## අම්බලංතොට ආණ්ඩුවේ වී මොලේ වී නිවුඩු (නො. 2) විකිණීම

අම්බලංතොට ආණ්ඩුවේ වී මෝලේ ඇති වී නිවුඩු (නො. 2) මිලට ගැනීමට කැමති අයගෙන් මිල ගණන් අඩංගු ටැන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 25 වෙනි බදාදා අ. භා. 2 ක දක්වා, මාතර සිටින සහකාර ගොවිජන සේවා කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ. අම්බලං තොට රජයේ වී මෝලේ, කළමණාකාර තැනගෙන් සැම්පල් ලබා ගැනීමට පුළුවන.

දැනට හොණ්ඩර 1,000 ක් පමණ ගබඩාකර ඇති අතර, 1959 සැප්තැම්බර් මාසය තෙක් මසකට හොණ්ඩර 500 (කිට්ටු වශයෙන්) ගණනේ විකිණීමට හැකිවනු ඇත. ඉල්ලුම් කරුවන් විසින් :—

(අ) ගෝනිත් සමඟ ; සහ

(ආ) ගෝනි නොමැතිව—ගෙවීමට කැමති මිල ගණන් සඳහන් කළ යුතුය.

වී නිවුඩු මුළු තොගයටම එකවර මුදල් ගෙවා සතිපතා බඩු ගෙනයා යුතුය.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1959 මාර්තු 3 වැනි දින,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය,
තැ. පෙ. 579,
කොළඹ 10.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ඕලුමැන්ඩල්හි කම්කරුවන් සඳහාවූ රුපියල් 5 ගේ පරණ නිවාස වැඩිදියුණු කිරීම

ඕලුමැන්ඩල්හි කම්කරුවන් සඳහාවූ රු. 5 ගේ පරණ නිවාස වැඩි දියුණු කිරීම සඳහා සීල් තබතලද ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ ජනසතුසේවා සහ මාර්ග ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් භාරගනු ලැබේ. එදින පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන් හට පෙනී සිටිය හැක.

කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් පෝර්මවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩරය ඉදිරිපත් කළයුතුය. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ඇතුලත් ලියවිලි හා සැලැස්මයන්ද එම කාර්යාලයේදී පරීක්ෂා කළහැක.

අප්‍රියෙල් මස 7 වෙනි අඟහරුවාදා මධ්‍යාහ්නයේ 12 දක්වා පමණක් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000 ට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර් පෝර්මකොළ නිකුත් කරනු ලැබේ. එබඳු අය පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලියා පදිංචිය ඔප්පු කිරීමට අවශ්‍ය ලියකියවිලි.

(ආ) රුපියල් 100 ක් තැන්පත් කළ ටෙන්ඩර් තැන්පත් කුවිතාන්සිය.

ටෙන්ඩර් සඳහාවූ තැන්පත් මුදල් කොළඹ වරාය කොමිෂමේ සරෆ් තැන වෙත තැන්පත් කළ යුතුය.

ඩී. ජී. දයාරත්න,
වරාය කොමසාරිස්.

---

## රේගු දෙපාර්තමේන්තුවේ ගන රත්රන් සහ රන්කාසි ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් ගන රත්රන් සහ රත්රන් කාසි විකිණීම සඳහා ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමන් ගෙන් බලය ලත් රජයේ ලියාපදිංචි වී සිටින ස්වර්ණාභරණ නිපදවන්නන්ගෙන් ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

| | |
|---|---|
| එකක් ටෝලා 10 ක් බර ඇති රන්පොලු | 8 යි |
| ටෝලා 1.65 සහ 3.29 බර ඇති රන් කැබලි | 2 යි |
| පෙසෝ පනහේ රන් කාසි | 5 යි |

2. ටෙන්ඩර් පත් කවරයක බහා හස් (මුද්‍රා) ඔබා කවරයෙහි වම් කෙළවරේ “ ගන රත්රන් සහ රත්රන් කාසි ” ය යි සඳහන් කර, කොළඹ ප්‍රධාන රේගු අයකැමි තුමන් නමට එවිය යුතු යි.

3. ටෙන්ඩර් භාර ගැනීම 1959 මාර්තු මස 24 වැනි අඟහරුවාදා පෙ. ව. 9.30ට නිම වෙයි. රේගුවේ නියෝජ්‍ය අයකැමි විසින් ටෙන්ඩර් විවෘත කරනවිට, ටෙන්ඩර් කරුවන්ට එය නැරඹීමට අවසර දෙනු ලැබේ.

4. ටෙන්ඩර් පිළිබඳ නියමිත පුරවූ පත් (පෝම්ස්) කොළඹ ජෙටියේ ගාස්තු නිලධාරි තැන ගෙන් ලබාගත හැක්කේ එක එක පුරවූ පතක් සඳහා රු. 100ක් තැන්පත් කිරීමෙනි.

5. කාර්යාල ඇර තබන නියමිත වේලාවන්හි දී මේ රත්රන් පරීක්ෂා කිරීමට හැකිය.

6. ටෙන්ඩර් පත් ගෙනැවිත් රේගු කාර්යාලයේ තබා ඇති පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. නො එසේ නම්, රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතු යි. කිසිම කරුණක් උදෙසා නියමිත කාල සීමාවෙන් පසුව ටෙන්ඩර් පත් භාරගනු නො ලැබේ.

7. ගැනුම්කරු විසින් මුළු මුදල ගෙවා රත්රන් රැගෙන යාමට පෙර, ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමන් ගෙන් ලබාගත් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

8. ටෙන්ඩර් පිළිබඳ අවශ්‍යතාවන් සපුරා ඇති අයදුම් කරුවන් පුරවූ පත් සඳහා තැන්පත් කරන ලද රු. 100, විකිණීම හමාර වූ පසු මේ කායසීලයෙන් පෙරලා ලබා ගැනීමට කුවිතාන්සිය සමග ඉල්ලුම් කළ යුතු යි.

9. කිසිදු හේතුවක් නො පෙන්වා ටෙන්ඩර් පත් එකක් හෝ සියල්ලම භාර නො ගැනීමට හෝ විකිණීම අවලංගු කිරීමට හෝ බලය රේගුවේ ප්‍රධාන අයකැමි සතු ය.

ඕ. ආර්. රයිට්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

ඒ. ඕ. 127.
1959 මාර්තු 6 වැනි දින,
කොළඹ, රේගු දෙපාතීමේන්තුවේ දී ය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

රත්නපුරයේ දිස්ත්‍රික්ක ගරාජය උදෙසා පහත පෙනෙන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ටෙන්ඩර පත්‍ර එවන ලෙස කොළඹ 5, කිරුළ පාරේ 200වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපතී මහතා විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ :—

(අ) ඉංජිනේරු කායසීලවල්.
(ආ) කම්කරුවන්ගේ කැන්ටිම සහ විශ්‍රාම කාමරය.
(ඇ) ගබඩා.
(ඈ) සර්විස් වැඩ මඩුව, සර්විස් වැඩ වේදිකාව (සර්විස් රූම්ස්), ලුබ්‍රිකේටිං කාමරය.
(ඉ) ටයර ගබඩාව.
(ඊ) කායසීලසවල්.
(උ) ඉංජිනේරු අංශය සහ ධාවන අංශය සඳහා වැසිකිළි පේළි.
(ඌ) සියලු ගොඩනැගිලිවලට වතුර පයිප්ප ආදිය දැමීම.

ටෙන්ඩර පත්‍ර බාරගැනීම 1959යේ අප්‍රේල් මස 8වෙනි ද වන බදාදා පෙ. ව. 10ට නවත්වනු ලැබේ.

මේ සඳහා ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ නම් රු. 1,50,000 කට හෝ ඊට වැඩියෙන් වියදම් වන කර්මාන්ත සඳහා ලියාපදිංචි කරනු ලැබූ ආණ්ඩුවේ කොන්ත්‍රාත්කාරයෝ පමණකි.

ටෙන්ඩර ලිපි දිය හැක්කේ බොරලැස්ගමුවේ වේරහැර මධ්‍යම වැඩපොළේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සිවිල් ඉංජිනේරු මහතාගේ කායසීලයෙහි රු. 200ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළාට පසුවය.

ඒ සිවිල් ඉංජිනේරු මහතා විසින් 1959යේ අප්‍රේල් මස 4වෙනිදා වන සෙනසුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර ලිපි දෙනවා ඇත.

සියලු ටෙන්ඩර පත්‍ර ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1959 මාර්තු 7 වෙනි දින,
කොළඹ 5.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

මීතොටමුල්ලේ දිස්ත්‍රික්ක ඩිපෝවෙහි පහත පෙනෙන කර්මාන්ත කිරීම පිණිස ටෙන්ඩර පත්‍ර එවන ලෙස කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ :

(අ) කම්කරුවන්ගේ කැන්ටිම සහ විශ්‍රාම කාමරය.
(ආ) වතුර පයිප්ප ආදිය දැමීම.
(ඇ) වැසිකිළි සහ නානකාමර ඉදිකිරීම.
(ඈ) වැටවල් සෑදීම.

ටෙන්ඩර පත්‍ර බාරගැනීම 1959 යේ අප්‍රියෙල් මස 8 වෙනි ද වන බදාදා පෙ. ව. 10ට නවත්වනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ නම් රුපියල් 60,000 ක් හෝ ඊට වැඩි වියදමක් යන කර්මාන්ත වෙනුවෙන් ලියා පදිංචි කරනු ලැබූ ආණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවෝ පමණකි.

ටෙන්ඩර ලිපි දියහැක්කේ බොරලැස්ගමුවේ වේරහැර මධ්‍යම වැඩපොළේ සිවිල් ඉංජිනේරු මහතාගේ කායසීලයෙහි එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් රුපියල් 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළාට පසුවය.

1959 යේ අප්‍රියෙල් මස 4 වෙනි ද වන සෙනසුරාදා දවල් 12 වන තෙක් සිවිල් ඉංජිනේරු මහතා විසින් ටෙන්ඩර පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර ලියා එවිය යුත්තේ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් දෙන පෝරම කොළවලය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1959 මාර්තු 6 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි
ස්ථානයෙහි වූ ලේකම් කොට්ඨාශයේ දීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

සැහැල්ලු වර්ගයේ G.I. පයිප්ප සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර නාරාහේන්පිට කිරුළ පාරෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959යේ අප්‍රේල් මස 22 වෙනිදා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. මේ පෝරම කොළ බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කායසීලයෙන් 1959 අප්‍රේල් මස 21වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ඒවා දෙන්නේ රු. 50ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විටය.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කායසීලයෙන් විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1959යේ මාර්තු මස 9වෙනිදා,
කොළඹදීය.

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ජලය සැපයීමේ යෝජනා ක්‍රමය—දඹුල්ල

මාතලේ දිස්ත්‍රික්කයේ සුළු නගර සභාවේ දඹුල්ලට නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා කොල්ලුපිටියේ ටරට් පාරේ අංක 135 දරණ ස්ථානයේ පිහිටි පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින්, මුද්‍රා තුබූ ද්විත්ව ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර 1959 අප්‍රේල් මස 13 වැනි සඳුදා උදේ 9.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ කොළඹ පරණ මහ ලේකම් කාර්යාලයේ අංක 267 දරණ කාමරයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (සතියේ දිනවල උදේ 9 සිට සවස 4 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 9 සිට 10 දක්වාත් වූ කාලය තුළදී) හෝ රුපියල් 250ක මුදලක් තැන්පත් කොට එයට ලැබෙන රිසිට්පුව ඉදිරිපත් කිරීමෙන් කොළඹ නෙලුම් පොකුණ පාරේ අංක 54 දරණ ස්ථානයේ පිහිටි ජල කර්මාන්ත ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබා ගත් ආකෘති පත්‍රයක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතු ය.

3. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ජල කර්මාන්තය සහ කාණු දැමීමේ කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ද, කොළඹ නාගරික සභාවේ රුපියල් 50,000 කට වඩා තක්සේරු කර ඇති වැඩ සම්බන්ධයෙන් ද ලියා පදිංචි වූවන්ට 1959 අප්‍රේල් මස 4 වෙනි සෙනසුරාදා උදේ 10ට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනවා ඇත. ඉදින් දේශීය කොන්ත්‍රාත්කරුවන්, ලියාපදිංචි කළ කවරයක ඔවුන්ගේ ටෙන්ඩර් එවීමට අදහස් නොකරතොත්, කවරයේ පිට ඇත්තේ විශේෂ වැඩයත් ඔවුන්ගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙලත්, සඳහන් කොට අංක 135 දරණ ස්ථානයේ පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයාට ටෙන්ඩර් භාර දිය යුතු ය.

4. ටෙන්ඩර්කරුවෝ ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දිනයේ පටන් සති හයක කාලයක් තැබිය යුත්තාහ.

5. ටෙන්ඩර් විවෘත කරන දිනය වූ 1959 අප්‍රේල් 13 වෙනි දින උදේ 10ට ටෙන්ඩර්කරුවන් කොළඹ ටරට් පාරේ අංක 135 දරණ ස්ථානයට පැමිණ සිටිය හැක. කළයුතු වැඩ සහ ඒ පිළිබඳ තොරතුරු විස්තර (ආණ්ඩුවේ නිවාඩු දින හැර) සියලු ම සතියේ දවස්වල උදේ 9 සිට සවස 4.30 දක්වාත් සෙනසුරාදා දිනවල උදේ 9 සිට පස්වරු 1 දක්වාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජල කර්මාන්ත ඉංජිනේරු මහතා ගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

ඊ. ඇප්. ඩයස් අබේසිංහ,
වැඩ බලන ප. පා. කො. වෙනුවට.

## කොළඹ කච්චේරිය

මීගමුවේ කුන්ඩන්විල පාරේ වඩුකර්මාන්ත පාසල් ගොඩනැල්ලක් ඉදිකිරීමට සහ සිදුව, අම්බලම්මුල්ලේ රජයේ මැටිකම්මාන්ත මධ්‍යස්ථානයේ යන්ත්‍ර සවිකිරීමට කොළඹ රජයේ ඒජන්තතැන විසින් පහත සඳහන් ඇඹිරසයේදී 23.3.59 වන දින සවස 2.30 වනතෙක් සීල්තැබූ ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. 20.3.59 වන දින ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර සඳහා පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

ඇස්. සිවගුරුනාදන්
කොළඹ ඒජන්ත තැන වෙනුවෙන්.

ග්‍රා. ස. සහ ගෘ. ක. කොළඹ දිස්ත්‍රික් කාර්යාලය,
කච්චේරිය, කොළඹ, 1959 මාර්තු, 6 වනදා.

---

## ටෙන්ඩර් දැන්වීමයි

මාතර දිස්ත්‍රික්කයේ පිහිටි පහත සඳහන් එක් එක් ගමෙහි, ඕවර්සියර්වරුන් සඳහා නිවාසය බැගින් නිවාස 5ක් තැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

| ගම | | නිවාස තැනිය යුතු ස්ථානය |
|---|---|---|
| (1) කඹුරුපිටිය | ... | අංක 13434 දරණ මූලික සැලැස්මේ නම්වර 6 දරණ කැබැල්ල. |
| (2) අකුරුගොඩ | ... | අංක 11515 දරණ මූලික සැලැස්මේ නම්වර 365, 366, 368 හා 370 දරණ යාව පිහිටි කැබලිවලින් එකක්. |
| (3) පස්ගොඩ | ... | අ ග සි 21, නම්වර 117 දරණ කැබැල්ල. |
| (4) මූලටියන | ... | අ ග සි 129, නම්වර 64 දරණ කැබැල්ල. |
| (5) බෙරලපනාතර | ... | අ ග සි 33, නම්වර 225 හා 225 ඒ දරණ කැබැල්ල. |

2. මාතර දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ මෙම ටෙන්ඩර් තැන්පත් කළයුතුය. එසේ නැතහොත් ඒවා ලියාපදිංචි කළ තැපෑලෙන් මාතර දිසාපති තැන වෙත එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ වම්පස උඩ කෙළවරේ "ඕවර්සියර් වරුන්ගේ නිවාස තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි. 1959 අප්‍රේල් මස 3 වැනි දින උදේ 9.30ට පෙර සියළුම ටෙන්ඩර් පත්‍ර මාතර දිසාපති තැන වෙත ලැබෙන්ට සැලැස්විය යුතුයි.

4. සෑම ටෙන්ඩරයක්ම එවිය යුත්තේ මාතර දිසාපති කාර්යාලයයෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රයකය. මෙම ආකෘති පත්‍ර 1959 අප්‍රේල් මස 1 වැනි දින සවස 3.00ට පෙර, රු. 10ක මුදලක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත්කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් දිසාපති කාර්යාලයයෙන් ලබාගත හැකිය. 1959 අප්‍රේල් මස 3 වැනි දින උදේ 9.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. මෙම අවස්ථාවේදී අයදුම්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

5. යටකී පළමුවැනි ඡේදයේ සඳහන් එක නිවාසයක් සඳහා හෝ සියල්ල සඳහා හෝ ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකිය.

6. තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බවට ලිපියකින් දැන්වීමක් කොට දින දහයක් ඇතුළත දී ගිවිසුමකට අත්සන් කිරීම හෝ නියම කරන ලද ඇප මුදලක් තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කරනු ඇත. ටෙන්ඩරය පිළිගත් බවට, ටෙන්ඩරයේ සඳහන් ලිපිනයට ලිපියක් යවන ලද නම්, (තැපෑලෙන් හෝ වෙන අයුරකින්) එම ලිපිය ඉල්ලුම්කරුට ලැබුණ සේ සලකනු ඇත. ගිවිසුමකට අත්සන් කිරීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ඇත.

7. ටෙන්ඩරයේ සඳහන් වැඩ නිසියාකාර හා නියම දිනට පෙර සම්පූර්ණකර දීමට බැඳුණු බවට, තෝරාගත් ඉල්ලුම්කරු විසින් නියමකරණ ලද පරිදි (ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5) ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂෙප කිරීමට සම්පූර්ණ අයිතිය මාතර දිසාපති තැන වෙත තිබේ.

9. කිරීමට ඇති වැඩ, ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි, ගිවිසුම් පත්‍ර, ආදි කරුණු පිළිබඳ සියළු විස්තර කායසීලයීය වේලාවන්හිදී මාතර දිසාපති කාර්යාලයයෙන් දැනගත හැක.

ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක,
මාතර දිසාපති තැන වෙනුවට.

1959 මාර්තු 5 වෙනි දින,
මාතර කච්චේරියේදී ය.

## ටෙන්ඩර් දැන්වීමයි

පහත සඳහන් වැඩ පිළිබඳව, කෑගල්ලේ දිසාපති තැන විසින් 1959 අප්‍රේල් මස 6 වැනි දින දවල් 12 වන තුරු ගොඩනැගිලි වැඩ ගැන මනා පළ පුරුද්දක් ඇති රජයේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(1) ගැවිලිපිටිය ගොවිජනපදයේ පොදු ළිං 3 ක් සෑදීම.
(2) දෙඹගොල්ල ගොවිජනපදයේ පොදු ළිදක් සෑදීම.
(3) අලවත්ත ගොවිජනපදයේ පොදු ළිං 3 ක් සෑදීම.
(4) හිනාබෝව ගොවිජනපදයේ පඩි පෙලක් සෑදීම.
(5) කැන්දව කොටසේ අඩි පාලමක් සෑදීම.

2. ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කිරීමේ හෝ භාර ගැනීමේ බලය කෑගල්ලේ දිසාපති තැනට තබාගෙන ඇත.

3. ටෙන්ඩර් පත්‍ර සහ වැඩ පිළිබඳ වැඩිදුර විස්තර 1959 අප්‍රේල් මස 1 වැනි බදාදා දවල් 12ට පෙර කෑගල්ලේ දිසාපති තැනගෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
කෑගලු දිසාවේ රජයේ දිසාපති.

1959 මාර්තු 5 වැනි දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

---

## කැකිරාව නගරසභා

**නිවාස යෝජනා ක්‍රමයේ 1 වෙනි අවස්ථාව ඉදිකිරීම සඳහා ටෙන්ඩර්**

කැකිරාව නගරසභාපතිතුමා විසින් කැකිරාවේ නිවාස යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා ප්‍රසිද්ධ කම්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 50,000.00 හෝ ඉන් ඉහළ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 30 දින දක්වා භාරගනු ලැබේ.

1959 මාර්තු මස 19 සිට 28 වෙනිදා දක්වා ටෙන්ඩර් තැන්පත් රු. 50.00ක් ද ටෙන්ඩර් ගාස්තු රු. 25.00ක් ද කැකිරාවේ නගරාධිපතිතුමා වෙත තැන්පත් කොට ලදුපත් ඉදිරිපත් කෙරීමෙන් මුද්‍රිත පෝරම, නත් නගරසභාවෙන් ලබාගත යුතුයි. ටෙන්ඩර් ගාස්තු මුදල ආපසු ගෙවනු නොලැබේ.

වැඩි විස්තර කැකිරාවේ නගරසභාවෙන් කායසීල වේලාවන්හිදී දැනගත හැකිසි.

ජී. ඩී. ඩේවිඩ්,
කැකිරාවේ නගරසභාපති තැන.

කැකිරාව නගරසභා කායසීලය,
1959.3.2 දින දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

1959ක් වූ ජනවාරි මස 30 වෙනි දින අංක 11,655 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ තංගල්ල-හම්බන්තොට පාරේ කහඳාව නමැති ප්‍රදේශයේ හාල් ගබඩාවක් සෑදීම සඳහා පළ වූ ටැන්ඩර් දැන්වීම සම්බන්ධව, ටැන්ඩර් පෝර්ම ලබාගත යුත්තේ හම්බන්තොට ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් නොව තංගල්ලේ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් බව මෙයින් දන්වනු ලැබේ.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂක වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1959.3.10.

---

කොළඹ රාජකීය විද්‍යාලයේ වහලේ විශේෂ අළුත් වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ, බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද, පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.10.

---

කොළඹ, ජාතික මුදල් ඉතිරි කිරීමේ දෙපාර්තමේන්තුවේ මහ ලේකම් කාර්යාල භූමියේ ඇති ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ, බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.10.

---

කළුතර විද්‍යාලයට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 අප්‍රේල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 59.3.10.

---

කළුතර සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂක තැනගේ හා වෙනත් නිලධාරීන්ගේ නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම් කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 100,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 59.3.10.

---

කළුතර සෞඛ්‍ය ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාර දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝරම් කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 255,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 59. 3. 10.

හොරණ තක්සිලා විද්‍යාලයේ කටුකම්බි වැටක් ආදිය ඉදි කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 9,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.3.10.

---

හෝමාගම යුද්ධ හමුදා කඳවුරේ විවාහක ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හෝමාගම ආ. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 300,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.10

---

මාතලේ රජයේ නිලධාරීන්ගේ නිවාස තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 285,000ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.10.

---

ගාල්ලේ ආරෝග්‍ය ශාලාවේ ට්‍රාන්ස්ෆෝමර් කාමරයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ගාල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට, නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්‍යාලයේ දීය, 59.3.10.

---

දියතලාවේ රාජකීය ලංකා ගුවන් හමුදාවේ, ගුවන් හමුදාවේ ගුවන් නිලධාරීන්ගේ මෙස් එක විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. දියතලාවේ ආ. වැ. දෙපාතර්මේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959යේ මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. .

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය. 59.3.10.

පුත්තලමේ රජයේ පොදු නිවාස සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959 යේ අප්‍රියෙල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පුත්තලමේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ මාර්තු මස 26වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 160,000 ට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.10.

---

බදුල්ලේ පුවක්ගොඩ මුල්ලේ රජයේ පොදු නිවාස තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1959යේ අප්‍රේල් මස 8 වෙනි බදාදා පෙරවරු 9.30 වන් තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. බදුල්ලේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1959 යේ මාර්තු මස 26වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 100,000ට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය. 59.3.10.

# බඩු බාහිරාදිය විකිණීම්

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් අංක ඉසෙඩ් 9775 දරණ "මොරිස් කොමර්ෂල්" වර්ගයේ වෑන් රථය 1959 මාර්තු මස 28 වැනි සෙනසුරාදා පෙරවරු 10.30ට යාපනයේ බන්ධනාගාර භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෑන් රථය මිළයට ගත් අය විසින්, වෙන්දේසිය අවසාන වූ වහාම සම්පූර්ණ මුදල ගෙවිය යුතු අතර, දින 3ක් ඇතුළත දී රථය ගෙන යා යුතුය.

3. සතියේ දින වල පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා කාලය තුළදී මෙම රථය පරීක්ෂා කළ හැකිය.

බී. ජේ. ඇස්. ද ඉසෙඩ්. ආදිහෙට්ටි,
යාපනේ වැඩ බලන බන්ධනාගාර අධිකාරී.

1959 පෙබරවාරි මස 26 වැනි දින,
යාපනේ බන්ධනාගාරයේදීය.

---

## රේගු දෙපාර්තමේන්තුවේ කෙරෙන විකිණීමයි

රේගු ආඥාපනත යටතේ 1959 මාර්තු මස 17 වැනි දින පෙරවරු 10.00ට අංක 1 දරණ බැග්බඩ් ගුදමේ දී පහත සඳහන් බඩු විකිණීම පිණිස ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වනු ලැබේ.

2. (කාන් ඔරලෝසු කනුව ඉදිරිපිට) රේගුවේ අපනයන ශාඛා කාර්යාලයේ ප්‍රධාන නිලධාරී තැනට දන්වා 1959 මාර්තු මස 16 වැනි දින පෙරවරු 9.30 සිට එම බඩු පරීක්ෂා කළ හැකිය. වෙන්දේසිය පිළිබඳ කොන්දේසි අඩංගු දැන්වීමක් 1954 මැයි මස 28 වැනි දින අංක 10,675 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වී ඇත.

3. වෙන්දේසි ස්ථානයට යාමට බලපත්‍ර වරායේ බලපත්‍ර නිලධාරී තැනගෙන් ලබාගත හැකිය.

ජේ. වී. ෆොන්සේකා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය පී.බී.ඇම්. 30/59.
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ නිවාරණ කාර්යාලයේදීය.
1959 මාර්තු 6.

ලංකාවේ තේ කොළ පෙට්ටි 830 සම්පූර්ණ බර රාත්තල් 20,750ක් පමණය.

---

# විවිධ දැන්වීම්

## අරක්කු තැබෑරුමක් පිහිටුවන භූමිභාගය පිළිබඳ දැන්වීමයි

අරක්කු විකිණීම පිණිස, අංක 5 දරණ මාවතගම අරක්කු තැබෑරුමය කියා අලුත් තැබෑරුමක් මෙහි පහත සඳහන් භූමිභාගයෙහි පිහිටුවීමට අදහස් කර ඇති බව මෙයින් දන්වමි.

2. අදහස් කොට ඇති භූමිභාගයෙහි එවැනි තැබෑරුමක් පිහිටුවීම ගැන විරුද්ධ වන අය ඊට හේතු ලියා මෙහි පහත අත්සන් කරන මා වෙත, 1959 අප්‍රේල් මස 24 වැනිදා දවල් 12 පසුවෙන්ට මත්තෙන්, එවීම යෙහෙකි. විරෝධය පළකොට එවන ලියුම් එකී දින එකී වේලාවට කලින් මා වෙත නොලැබුණොත් බාර ගනු නොලැබේ.

3. නියමිත පරිදි ලැබුණ ලියුම්, 1959 අප්‍රේල් මස 27 වැනිදා ප. ව. 3ට මගේ කාර්යාලයේදී සැලකිල්ලට භාජන කරනු ලැබේ. විරෝධය ප්‍රකාශ කොට කලින් ලියුමක් එවා ඇති ඕනෑම කෙනෙකුට කැමති නම් එදින ඒ වේලාවට මගේ කාර්යාලයට අවුත් සාක්ෂි කීමට ඉඩ තිබේ.

### අදහස් කොට ඇති භූමිභාගයේ විස්තරය

මාවතගම නගර සීමාව තුළ

ඒ. ඇල්. පෙරේරා,
ආණ්ඩුවේ ඒජන්තතැන.

1959 මාර්තු 5 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

## අරක්කු තැබෑරුමක් පිහිටුවන භූමිභාගය පිළිබඳ දැන්වීමයි

අරක්කු විකිණීම පිණිස, අංක 4 දරණ කුරුණෑගල අරක්කු තැබෑරුමය කියා අලුත් තැබෑරුමක් මෙහි පහත සඳහන් භූමිභාගයෙහි පිහිටුවීමට අදහස් කර ඇති බව මෙයින් දන්වමි.

2. අදහස් කොට ඇති භූමිභාගයෙහි එවැනි තැබෑරුමක් පිහිටුවීම ගැන විරුද්ධ වන අය ඊට හේතු ලියා මෙහි පහත අත්සන් කරන මා වෙත, 1959 අප්‍රේල් මස 15 වැනිදා දවල් 12 පසුවෙන්නට මත්තෙන්, එවීම යෙහෙකි. විරෝධය පළකොට එවන ලියුම් එකී දින එකී වේලාවට කලින් මා වෙත නොලැබුණොත් බාරගනු නො ලැබේ.

### අදහස් කොට ඇති භූමිභාගයෙහි විස්තරය

අංක 2 වැවපාර, 3 මස්කඩ වීථි, 5 පොල්අත්තාපිටිය, 6 ඡගට්ටුවාන, 8 උඩ වල්පොල සහ 9 මධ්‍යම යන කොට්ඨාශ වලින් එක කොට්ඨාශයක.

ඒ. ඇල්. පෙරේරා,
ආණ්ඩුවේ ඒජන්තතැන.

1959 මාර්තු 5 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

## විශෙෂ නිවේදනයයි

1959 මාර්තු 27 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 මාර්තු මාසයේ හතරවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මාර්තු 23 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 10 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.